# කුඩකූඩුව



ඉඳුතරා අප්සාරි

# කැඩකෑඩුව

ඉඳුතරා අප්සාරි

# කුඩකූඩුව


## ඉඳුතරා අප්සාරි

කතෘ


කතෘගේ වෙනත් කෘති

හාවට පාඩමක්

හිත හොඳ කපුටා

මලීගේ කතාව

සතුටු මල්


හාමායා බාලිකා විද්‍යාලය

5 ශ්‍රේණිය B

2026.05.10

ISBN 978-624-211-205-3

# පිදුම

සිප් කිරි පොවා
මා නිති දැඩි කරන
ආදර වදන් දී
ගුණ යහපත් කරන
හෙට ලොව දිනන්නට
නිරතුරු මඟ සදන
ආදරණීය ගුරුතුමාට
පිළිගන්වමි
මේ පොත් පිංච



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම් පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,  
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.  
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.  
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ජූනියර් කියන්නේ අහංකාර පිරිමි ළමයෙක්. එයා කියන කිසිම දෙයක් අහන්නේ නැහැ. ඒ වගේම හරිම දඟයි. එයාගේ සතුට ගැන විතරමයි හිතුවේ. දවසක් ජූනියර් එයාගේ අම්මත් එක්ක බඩු ටිකක් ගන්න කඩේට ගියා. ජූනියර් දැක්කා ලස්සන කුඩයක්. කුඩේ අරගෙන දෙන්න කියලා ජූනියර් අම්මාට බල කළා. "අද බැහැ. වෙන දවසක අරන් දෙන්නම්" අම්මා කිව්වා. ජූනියර් කුඩේ ඉල්ලලා බිම වැටීගෙන අඬ අඬා කෑ ගැහුවා. අම්මට කරන්න දෙයක් නැති නිසා කුඩය අරගෙන දුන්නා.



ජූනියර් බඩු ඔක්කොම අම්මාට දීලා කුඩේ අතට අරගෙන නට නටා ගෙදර ගියා. කෑම කාලා උඩුමහලට ගිහින් ටෙඩීව ඇඳෙන් අයින් කරලා ඇඳෙන්ම කුඩේ තියාගත්තා. ජූනියර් නිදා ගත්තා.
"රින් රින් රින්" ඔරලෝසුව කෑ ගැහුවා. ජූනියර් නැගිටලා මූණ සෝදලා ඇඳුම් ඇඳගත්තා. කොණ්ඩෙත් පීරගෙන, බෑගයත් අරගෙන පහළ මාලයට බැස්සා. අම්මා හදලා තිබුණ කිරි වීදුරුවත් බීලා සැන්ඩ්විච් එක  කන්න පටන් ගත්තා. "පරක්කුයි ජූනියර්" අම්මා සද්දෙන් කිව්වා. ජූනියර් කට පිහදාමින් උඩුමහලට දිව්වා. එයා ආපහු ආවේ කුඩේ අරගෙන.



ජූනියර් ඉස්කෝලේ යන්න ගෙදරින් එළියට බැහැලා ගෙදර නොපෙනෙන ඈතට ගිහින් කුඩේ ඉහලාගත්තා. පිට ඉන්න හැම සතෙක්ම ජූනියර්ට විහිළු කරනවා වගෙයි ජූනියර්ට දැනුනේ. එයා ගලක් අහුලාගෙන ගහක හිටපු වඳුරෙකුට ගැහුවා.වඳුරා ජූනියර්ට විරිත්තලා කැලේට පැනගත්තා.



ජූනියර් ඉස්කෝලෙට දුවගෙන ගියේ හරිම ආඩම්බරයෙන්. එයා කුඩේ ළඟම තියාගෙන ඒ දිහා බලාගෙනම හිටියා.
"ආයුබෝවන් ළමයි" ටීචර් පන්තියට ආවා.
"අද අපි කෘමීන් පරීක්ෂා කරන්න එළියට යනවා. හැමෝම තම තමන්ගේ කුඩයයි, වතුර බෝතලයයි අරගෙන එන්න" කියලා ටීචර් කිව්වා. ජූනියර්ට හරි සතුටුයි. එයා කුඩයත්, වතුර බෝතලයත් අරගෙන පේළියේ ඉස්සරහටම පැන ගත්තා.
හීන් පොද වැස්සක් ආව නිසා ජූනියර් ආඩම්බරයෙන් කුඩය ඉහළා ගත්තා. යාළුවෝ ජූනියර්ගෙන් කුඩය ඉල්ලුවා. ඒත් ජූනියර් කුඩය දුන්නේ නැහැ. එයා යාළුවන්ගේ කුඩවලට එයා හිනා වුණා.
එදා එළිමහන් ක්‍රියාකාරකම නිසා ජූනියර් ගොඩක් සතුටු වුණා.




පාසල නිම වී ගෙදර එන විටත් පොද වැස්සක් වැටුණු නිසා ජූනියර් ගෙදර ගියේත් නටමින්.
කුඩයත් ජූනියර් එක්ක තාලයට නැටුවා. යන අතරමගදී ලොකු සුළඟක් ඇවිත් කුඩය ගහගෙන ගියා. ජූනියර් කුඩය පස්සෙන් දිව්වා. සුළඟේ වේගය වැඩි වුණා. කුඩයත් වේගයෙන් පාවි පාවී ඈතටම ගියා. ජූනියර්ට දුවලා මහන්සි යි.



කුඩය කටු ගාලක් උඩ පැටලුනා. සුළඟේ වේගය අඩු වුණා. ජූනියර් දුවගෙන ගිහින් උඩ පැන්නා. ඒත් කුඩය ගන්න බැරි වුණා. ජූනියර් අඬන්න පටන් ගත්තා. තවත් හයියෙන් උඩ පැන්නා. අඬ අඬාම උඩ පැන්නා.පොද වැස්සට තෙමිලා හිටිය ජූනියර් අඬ අඬා තවත් උඩ පැන්නා. කුඩේ කටු ඇනිලා ඉරිලා යයි කියලා ජූනියර් බය වුණා.




උදේ ජූනියර්ගේ ගල්පහර වැදුන වඳුරා කටුගාලට උඩ අත්තේ ඉඳගෙන "කළ කළ දේ පල පල දේ" කියලා හිනාවුනා. වඳුරා කුඩය අරගෙන ළඟ තිබුණු කෝන් ගහ උඩට නැග්ගා. කුඩය ගහ මුදුනින් තියලා කැලෑවේ ඈතට ගියා. ජූනියර් කුඩය ගන්න සැලසුම් ගොඩක් හැදුවා.ගහට නැග්ගා, ලීයකින් ගන්න හැදුවා, ගෙදරට දුවලා ලණුවක් දැම්මා, පාරේ යන අයට කතා කළා. ඒත් ගන්න බැරි වුණා.



තමන්ගේ කූඩුව හදන්න කෝටු කැලි හොයාගෙන යන කපුටයි කපුටියි කුඩය දැක්කා. දෙන්නාම තොටිල්ලක් වගේ පැද්දෙන කුඩයට නැඟලා බැලුවා. ගහ යට ජූනියර් ඉන්නවා මේ දෙන්නා දැක්කෙ නෑ. ඒත් ජූනියර් සිද්ධ වෙන හැමදේම බලාගෙන ගහ යටට වෙලා අඬ අඬා හිටියා.



කපුටා පුළුන් පුළුන් ගෙනත් කූඩය ඇතුළට දැම්මා. කොළ දාලා ඇතිරිල්ලක් වගේ හැදුවා. ගහේ කොළ අතු වලින් හෙවන එන්න සැලැස්සුවා. ජූනියර්ගේ කුඩය කපුටු පවුලේ කුඩ කූඩුව බවට පත්වුණේ ඔන්න ඔහොමයි.



ජූනියර් ගෙදර දුවලා අම්මට කතාව කිව්වා. "තමන් විතරක් සතුටු වුනාම මදි. අනිත් අයගේ සතුට ගැනත් හිතන්න ඕනෑ." අම්මා ජූනියර්ගේ ඔලුව අතගාමින් කිව්වා. ජූනියර් ලැජ්ජාවෙන් බිම බලාගෙන අම්මාගේ ඇඟේ එල්ලුණා. එයාගේ කුඩය කුරුලු පවුලක ගෙදර වුණු නිසා ජූනියර්ට සතුටක් දැනුණා. ජූනියර් කඳුළු පිහදාගෙන හිනා වුනා. "මම මින් පස්සේ හැමෝගෙම සතුට ගැන හිතනවා. අම්මට කරදර කරන්නෙත් නෑ." ජූනියර් බිම බලාගෙනම කිව්වා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)